[අ.භා. 5.10]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. මුලින්ම කියන්න ඕනෑ, අපි තාවකාලිකව වැඩ අත්හිටුවන්න කියලා පෙබරවාරි මස 05වැනි දින නිකුත් කළ ලිපිය අදාළ වෙන්නේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය ව්‍යාපෘතිවලට බව. නමුත් ඊට මාසයකට පසුව, මාර්තු මාසයේ 04වැනි දා නැවත ලිපියක් යොමු කර තිබෙනවා, සියලු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය ඒ තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘති කොන්දේසි දෙකකට යටත්ව වහාම නැවත පටන් ගන්න කියලා. මම ඒ ගැනත් කියන්න කැමැතියි. එයින් එක කොන්දේසියක් අනුව ඒ ලබා දීලා තිබෙන කොන්ත්‍රාත්තු හරියාකාරව ලබා දීලා නැත්නම්, දූෂිත කොන්ත්‍රාත්තු තිබෙනවා නම් ඒවා තවමත් අත්හිටුවා තිබෙනවා.

අනෙක් එක තමයි, ජනාධිපතිවරණය කාලයේ ඔරලෝසු, ගැස් ලිප්, මහන මැෂින් යනාදි භාණ්ඩ බෙදීමට ගෙනැවිත් තිබුණා කියන එක. ඒවා බෙදීම තාවකාලික අත්හිටුවීමට යටත් වනවා. ඒ අනුව සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය, නමුත් තාවකාලිකව අත්හිටවූ සියලු ව්‍යාපෘති අර කොන්දේසි දෙකට යටත්ව පටන් ගැනීමට දැනුම් දීලා තිබෙනවා. අපේ ගරු ගීතාංජන ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, උපදෙස් ලබා දෙන්න කියලා. ඒ උපදෙස් ලබා දීලා තිබෙනවා. දිස්ත්‍රික් කාර්යාල හරහා ඒ උපදෙස් ලැබිය යුතු පුද්ගලයන්ට ලැබේවි. මම ඉතාම වගකීමෙන් කියනවා, අපේ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා එම තීරණය සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර තිබෙන බව. ඒ අනුව ඔය ප්‍රශ්නයට පිළිතුර තමයි, දැන් මේ කිව්වේ. එතකොට සියලු දෙනාට පැහැදිලියි, යථා තත්ත්වය මොකක්ද කියලා. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය ව්‍යාපෘති හැර වෙන කිසිම ව්‍යාපෘතියක් තාවකාලිකව හෝ නවත්වන්න කියලා නැහැ. ඒකත් වගකීමෙන් කියනවා. "මේවා නවත්වන්න ආණ්ඩුවෙන් කියා තිබෙනවා " කියලා කවුරු හෝ කියනවා නම්, ඒක එහෙම නොවෙයි.

**ගරු#ශාන්ත බණ්ඩාර මහතා**
*மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු#ශාන්ත බණ්ඩාර මහතා**
*மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, විශේෂයෙන්ම මේ ගෙනැත් තිබෙන ස්වයංරැකියා උපකරණ පිළිබඳව සහ ඒවා බෙදන්න එපා කියලා මේ වෙන කොට දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර තිබෙන කාරණය. අපේ මූලාසනය මඟින් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය අපි මේ සම්බන්ධව යොමු කරවනවා. විශේෂයෙන්ම ටෙන්ඩර් කරලා නියමිත සුදුස්සන් තෝරා ගෙනයි මේ සියල්ල ගෙනැවිත් තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමාට ඒ ගැන පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය කර තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධව කථා කිරීමේදී මට එක දෙයක් කියන්න අමතක වුණා. ඒ තමයි, ගෙනැවිත් තිබෙන උපකරණවලට ඒවා ලැබිය යුතු ප්‍රතිලාභීන්ගෙන් යම් කිසි මුදලක් අය කර ගෙන තිබෙනවා නම් ඒ භාණ්ඩත් බෙදන්න කියා තිබෙනවා.

**ගරු#ශාන්ත බණ්ඩාර මහතා**
*மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ක්‍රම දෙකකට ගෙනැවිත් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්, ක්‍රම දෙකකට. එක ක්‍රමයක් තමයි, ඔවුන්ගෙන් යම් කිසි මුදලක් අරගෙන තිබෙනවා නම් ඒ බඩුත් බෙදන්න කියලා තිබෙන එක. ඡන්දයට ගෙනාපු බඩු පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ. උදාහරණයක් හැටියට මම මේ කාරණය කියන්නම්. මම කෝට්ටේ නියෝජනය කරන සංවිධායකවරයා හැටියට අපේ පාර්ලිමේන්තුව හරහා මට ලැබෙනවා, විමධ්‍යගත අය වැයෙන් - DCB එකෙන්- ලක්ෂ 50ක්. එච්චරයි මට ලැබෙන්නේ. නමුත් එවකට ආණ්ඩුවේ සංවිධායකවරයාට -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ සන්ධානයේ සංවිධායකවරයාට- ලක්ෂ 300ක් ලැබෙනවා. ඊට අමතරව ඔහුට මිලියන 100, 200, 300 ලැබෙනවා, ආසනයේ වැඩ කර ගන්න. හරිම අසාධාරණ ක්‍රමවේදයක් තමයි එවකට රජය පවත්වාගෙන ගියේ. මම හිතන්නේ නැහැ, ප්‍රජාතන්ත්‍රවාදී රටක මන්ත්‍රීවරු හරහා ඔවුන්ගේ ප්‍රදේශවල සංවර්ධන වැඩ කටයුතු සිදු කළ යුත්තේ එහෙමයි කියලා. රජයට අමාත්‍යාංශ තිබෙනවා. ඒ අමාත්‍යාංශ හරහා වැඩ කරනවා. ඒවාට අපේ කිසි ගැටලුවක් නැහැ.

කෝට්ටේ මගේ ආසනයට ගිහිල්ලා බලන්න. හැම තැනම board ගහනවා. කාගේ හරි පින්තූරයක් ගහලා කියනවා, ඒ පුද්ගලයාගේ ව්‍යාපෘතියක්ය මේ ක්‍රියාත්මක වෙන්නේ කියලා. සාමාන්‍ය ජනතාව අපෙන් අහනවා, "මන්ත්‍රීතුමා ඔබතුමාට කරන්න බැරිද, මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ මන්ත්‍රී කෙනෙක් නේද, මන්ත්‍රීතුමාට කරන්න බැරිද, අනෙක් පක්ෂයේ කට්ටියට විතරද කරන්න පුළුවන්?" කියලා. එවැනි ක්‍රමවේදයක් තමයි අරගෙන ගියේ. එවැනි අසාධාරණකම් වුණා. ඔය මුදල් පාවිච්චි කරලා ඡන්දයට බෙදන්න ගෙනැල්ලා තිබෙන බඩු නම් බෙදෙන්නේ නැහැ, ඡන්දය ඉවර වෙන කල්. බෙදෙන්නේ ප්‍රතිලාභීන්ගෙන් මුදල් ගත්ත ඒවා පමණයි. ඉතාමත්ම පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. අපි කිසිම විධියකට සංවර්ධන වැඩ නවත්වන්න කියලා නැහැ. තාවකාලික අත්හිටුවීමක් කරලා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

තිබුණා, සමහර ව්‍යාපෘතිවලට පමණක්. ඒකත් මාසයක් පමණයි, අත්හිටුවලා තිබුණේ. ඒ අත්හිටුවීමත් දැන් ඉවත් කරලා තිබෙනවා.

තවත් දෙයක් කියන්න ඕනෑ. ගරු කබීර් හාෂිම් ඇමතිතුමාත්, ගරු ජෝශප් මයිකල් ඇමතිතුමාත් මේ ගැන කිව්වා. අපි හිතමු, allocation එක තිබෙන්නේ රුපියල් මිලියන 10යි කියලා. රුපියල් මිලියන 10යි වෙන් කරලා තිබෙන්නේ. නමුත් කොන්ත්‍රාත්කරුට ටෙලිෆෝන් එකෙන් කියනවා, "ඔබතුමා මිලියන 30ක වැඩ පටන් ගන්න, අපි ගෙවන්නම්" කියලා. එතකොට ඔහු මිලියන 30ක වැඩ පටන් ගන්නවා. පාරවල්වලට ගල් දානවා. ඒ වැඩේ කරගෙන යනවා. දේශපාලනිකව පෙන්වන්න හදනවා, "මෙන්න, අපි මේ වැඩ කරගෙන යනවා. සංවර්ධනය කරගෙන යනවා" කියලා. ඊට පස්සේ ඔවුන් බිල් අරගෙන එනවා. බිල් අරගෙන ඇවිල්ලා අපි පොතේ බලන කොට වෙන් කිරීමක් -allocation එකක්- නැහැ. වෙන් කිරීම තිබෙන්නේ රුපියල් මිලියන 10කට පමණයි. රුපියල් මිලියන 20ක වැඩ කරලා තිබෙන්නේ, කිසිම ටෙන්ඩර් පටිපාටියකින්, කිසිම ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරවයි. එතකොට අපි කොහොමද ඒවාට ගෙවන්නේ? අපි කොහොමද ගෙවන්නේ, ගරු මන්ත්‍රීතුමනි? අපි කොහොමද ගෙවන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මොකක්ද ඒකට කරන්නේ? ඔබතුමා මට කියන්න, ඒකට අපි මොකක්ද කරන්නේ කියලා. ලක්ෂ්මන් යාපා මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කියන්න එහෙම ඒවාට මොකක්ද කරන්නේ කියලා. අපි මොකක්ද කරන්න ඕනෑ? ටෙලිෆෝන් එකෙන් කියනවා, කරන්න කියලා. ඊට පස්සේ පාරවල -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ නම කිව්ව නිසා මම මේ පැහැදිලි කිරීම කරන්න ඕනෑ. ඒවා නීත්‍යනුකූලව ඔබතුමන්ලා කරන්න. ඔබතුමා කියන විධියට ඒවා කරන්න අවශ්‍යතාවක් නැහැ. බිල්පත් ඉදිරිපත් කරපු නීත්‍යනුකූල ඒවා ගෙවන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම ඒකට උත්තරය දුන්නා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සු දන්නේ නැහැ නේ, මෙක කළේ allocation එකක් තිබිලාද, නැද්ද කියලා. මිනිස්සු කියන්නේ, "බලන්න ඇමතිතුමා, අපේ පාරට භාගෙට තාර දාලා තිබෙනවා, ඉතුරු ටික දාන්න" කියලා. එහෙම නොකළොත් ඊට පස්සේ උද්ඝෝෂණ කරනවා. ඊට පස්සේ කියනවා, "දූවිලි යනවා. අපේ ළමයින්ට හුස්ම ගන්න බැහැ. ඉස්කෝලේ යන්න බැහැ." කියලා. නමුත් ඇත්ත වශයෙන්ම වෙලා තිබෙන්නේ, ඒක දූෂිත විධියට කරලා තිබෙන එකයි. මම දන්නේ නැහැ, මේවාට මොකක්ද කරන්නේ කියලා. අපේ අමාත්‍යාංශයට ඇවිල්ලා මේ ප්‍රශ්නය ගැන සියලුම දෙනාත් එක්කම කථා කළා. අපි කිව්වා, එහෙම නම් 2015 තිබෙන allocationවලින් මේවා කරන්න කියලා. වෙන මොනවා කරන්නද? ළමයින්ට ඉස්කෝලයට යන්නේ නැතුව ඉන්න බැහැ නේ, දූවිලි නිසා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා*** [**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**] ***මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்* [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. UDITHA LOKUBANDARA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කිව්වා, ඒක කරන්න 2015 allocationවලින් තමයි ගන්න වෙන්නේ කියලා.

අත්සන් කරලා තිබුණත් ඒ කටයුතු පටන් අරගෙන නැත්නම් ඒවා අපට කරන්න හැකියාවක් බොහෝ විට ලැබෙන්නේ නැහැ. මොකද, මේ ව්‍යාපෘති කරගෙන යන්න මුදල් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණයක් හැටියට ගත්තොත් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ගම්පහ දිස්ත්‍රික්කයේ නාන ළිං ප්‍රතිසංස්කරණය කිරීමේ තොරතුරු ඇතුළත් file එකක් මම දැක්කා. මේ නාන ළිං ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් ලක්ෂ පහ ගණනේ වෙන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කොහොමද මෙහෙම වෙන්නේ?

ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, නාන ළිඳක් ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් ලක්ෂ පහක් වැය වන්නේ කොහොමද කියලා ඔබතුමා මට කියන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ TA කෙනෙකු ඉන්නවා; TO කෙනෙකුත් ඉන්නවා. ඒගොල්ලන්ගේ ඇස්තමේන්තුවලට අනුව තමයි ඒ වැඩ කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හරියට හරි. දැන් මෙතැන ප්‍රශ්නය,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. (Dr.) Harsha De Silva, you have only one more minute.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හැම නාන ළිඳකටම රුපියල් ලක්ෂ පහක් වැය වෙන්න බැහැ නේ. සමහර නාන ළිං ලොකු වෙන්න පුළුවන්, සමහර ඒවා පොඩි වෙන්න පුළුවන්. දැන් ගරු ගීතාංජන ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ කාරණය ගැන කියපු නිසා මමත් කියන්නම්. ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ සභාපතිතුමා ඇතුළු නිලධාරින් පිරිසක් මම හමු වෙන්න ආවා. මම ඔවුන්ගෙන් ඇහුවා, "නාන ළිඳක් කපන්න නොවෙයි, පොඩ්ඩක් දිය සෙවෙල් ටික කඩලා, සිමෙන්ති ටිකක් දාලා ලස්සනට ප්‍රතිසංස්කරණය කරන්න කොපමණ මුදලක් වැය වෙනවාද?" කියලා. ඔවුන් මට කිව්වා, "ඇමතිතුමා, මෙකට

රුපියල් 25,000ක්, රුපියල් 30,000ක්, වැඩිම වුණොත් රුපියල් 50,000ක් යාවි" කියලා. රුපියල් 50,000ක් වැය වන වැඩේට රුපියල් ලක්ෂ පහක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ඉතුරු රුපියල් ලක්ෂ ගණනට මොකද වුණේ කියන ප්‍රශ්නය එහිදී මතු වෙනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මම කිව්ව ලැයිස්තුවේ එහෙම නාම ලේඛනයක් නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දාබරේ මහත්මයා, ප්‍රනාන්දු මහත්මයා මාව හමු වෙන්න ආවා. මම ඔවුන්ට මේ කාරණය විස්තර කරලා දුන්නා. ඔබතුමා ගිහිල්ලා ඔවුන්ට මේ කාරණය පිළිබඳව කියන්න. මමත් ඊයේ අපේ සංවිධායකතුමා වන ලෙනාඩ් කරුණාරත්න සමඟ අවිස්සාවේල්ලට - ඔබතුමාගේ ආසනයට - ගියා. අවිස්සාවේල්ලේ පාරවල් තුනක් ඉදිකිරීමේ කටයුතු නවත්වලා තිබුණා. මම ඔවුන්ට කිව්වා, "එන සතිය විතර වන කොට ඔවුන්ට නැවත මේ මුදල් ලැබේවි. මේ වැඩේ කරගෙන යන්න" කියලා. ඒවා ප්‍රමිතියට අනුව ක්‍රියාත්මක කරලා තිබෙනවා නම් ගැටලුවක් නැහැ. නාන ළිං පිළිබඳව මේ ලැයිස්තුවේ සඳහන් වෙලා තිබුණේ නැහැ. මම මේ කොන්ත්‍රාත් සංගමයේ සභාපතිගෙන් ඇහුවා, "නාන ළිඳක් ප්‍රතිසංස්කරණය කරන්න කොයි තරම් මුදලක් වැය වේවිද?" කියලා. එතුමා කිව්වා, "වැඩිම වුණොත් රුපියල් 50,000ක් යාවි" කියලා. [බාධා කිරීමක්] තව තත්පර 30කින් මම මගේ කථාව නවත්වන්නම්. මම හිතන හැටියට ඔබතුමන්ලාගේ සියලු ප්‍රශ්නවලට උත්තර මා මෙතැනදී බැන්දා. අපි එකතු වෙලා සාධාරණව, පක්ෂ භේදයකින් තොරව ඒ කටයුතු කරගෙන යමු කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Prof.) Tissa Vitarana. You have seven minutes.

[අ.භා. 5.23]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Thank you, Mr. Deputy Chairman of Commitees. මම මේ මතු කරන්න යන්නේ විශේෂයෙන් යටියන්තොට කොට්ඨාසයේත්, ඒ අවට තුන් කෝරළයේත් - කෑගල්ල දිස්ත්‍රික්කයේ - දැන් මතු වෙලා තිබෙන ප්‍රශ්නයක් පිළිබඳවයි. අනිකුත් තැන්වල වාගේම ඒ ප්‍රදේශයේත් යටිතල පහසුකම් දියුණු කිරීම පැත්තෙන් ගත්තාම පටන් ගත්ත වැඩ කොටස යම් ප්‍රමාණයකින් දියුණු වෙලා තිබියදී එක පාරටම එහි වැඩ කටයුතු නතර කරලා තිබෙනවා. ගිය අවුරුද්දේ අන්තිම මාස දෙකේ වැහි තත්ත්වයත්, මැතිවරණ තත්ත්වයත් එක්ක මේ මුදල් අවිච්ඡේද වෙලා තිබෙනවාය කියලා අපි දන්නවා. පෙබරවාරි දක්වා ඒ මුදල යොදවන්න පුළුවන් කියලා දැනුම් දීලා තිබුණත්, ඒ මුදල පාවිච්චි කරන්න ඉඩක් නොලැබුණු නිසා ඒ වැඩ නතර වෙලා තිබෙනවා. මාසයක් වැඩ නතර කරන්න නියම කළාය කියා (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්ව කාරණය මේකට බලපාන්න ඇති කියලා මම හිතනවා. මේ මාසයේ 04 වැනිදා තමයි ආපසු ලිපියක් ඇරලා තිබෙන්නේ මේ කටයුතු නැවත ආරම්භ කරන්න කියලා. මම ඒ ගැන සන්තෝෂ වනවා. මම බලාපොරොත්තු වනවා, ඒ නතර කරලා තිබෙන වැඩ කටයුතු ඉදිරි කාලයේදී කෙරෙයි කියලා. ඒ කොට්ඨාසවල පාරවල් කාපට් කිරීම මහා පරිමාණ කාපට් කිරීමක් නොවෙයි. සමහර තැන්වල කිලෝමීටර් 2ක්, කිලෝමීටර් 3ක් බස් යන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. මේ හේතුවෙන් ජනතාව දුක් විඳින නිසා තමයි අපි ඒ පාරවල් කාපට් කරන්න තීන්දු කළේ. දැන් ඒවාත් නතර වෙලා තිබෙනවා.

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමනි, කරුණාකර මේ ගැන සොයා බලා පුළුවන් තරම් ඉක්මනට ඒ මුදල් පාවිච්චි කරන්න සලස්වන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම කිතුල්ගල, බුලත්කොහුපිටිය බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළත් නතර කරලා තිබෙනවා. ඒ එක්කම මාතෘ නිවාස සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළත් නතර කරලා තිබෙනවා. මේ පටන් ගත්ත වැඩ පහසුවෙන්ම ඉදිරියට කර ගෙන යන්න පුළුවන්කම තිබෙනවා.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මුදල් අනුමත කරලා තිබුණාට ඒ මුදල් ලැබිලා නැහැ. යම් ව්‍යාපෘතිවල වැඩ පටන් ගන්නවත් පුළුවන් වෙලා නැහැ. පාරවල් කාපට් කිරීම ගැන කථා කරන කොට මම කියන්න ඕනෑ, වැඩ පටන් ගන්න මුදල් release කරලා නැති තවත් පාරවල් හතරක් තිබෙන බව. කරුණාකර ඒවා ගැනත් සොයා බලන්න පුළුවන් නම් එය ඉතා වැදගත් වේවි. මේ ආකාරයට මේ සංවර්ධන වැඩ පිළිවෙළවල් ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ.

පසු ගිය ආණ්ඩුව කාලයේ දී යටිතල පහසුකම් පිළිබඳව විතරක් නොවෙයි බැලුවේ. මානව සම්පත් අංශය ගැනත් බැලුවා. මම කියන්න සන්තෝෂයි, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ උපදේශක කාරක සභාව හරහා තාක්ෂණ විෂය ධාරාව දියුණු කිරීමේ වැඩ පිළිවෙළකට යන්න අපට පුළුවන් වුණා. ඒ එක්කම රසායනාගාර ආදී අංශ සියල්ලමත් දියුණු කරන්නට තිබෙනවා. මේවා සම්බන්ධවත් තිබුණු ප්‍රගතියේ බැස්මක් මේ කාලයේ දී ඇති වෙලා තිබෙනවා කියලා අපට පෙනෙනවා. කරුණාකර මේවා ගැනත් සොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. යටිතල පහසුකම් දියුණු කරනවා වාගේම, මානව සම්පත් දියුණු කිරීම සම්බන්ධයෙනුත් බර දමලා අපි ඉදිරියේ දී කටයුතු කරන්නට අවශ්‍යයි.

සංවර්ධන වැඩ පිළිවෙළවල් ගැන කථා කරනකොට මට පෙනෙන දෙයක් තමයි, අය වැය හරහා යම් සහන ලබා දීම මුල් කර ගෙන අනෙකුත් සංවර්ධන කටයුතුවලට යොදවන්න තිබෙන මුදල් ඒ වෙනුවෙන් යොදවන්නට ඔබතුමන්ලාට සිදු වෙලා තිබෙන බව. මැතිවරණයක් ළඟම තිබියදී ජනතාවට යම් යම් සහන ලබා දෙන්න ඔබතුමන්ලාට අවශ්‍යතාවක් තිබුණත්, ඒ කටයුත්ත කරන ගමන් මේ සංවර්ධන කටයුතු ගැනත් බලන්න. සංවර්ධනයට යොදන බර අඩු කරලා, ඒ බර වෙන පැත්තකට දමන්න එපා.

ආර්ථික විද්‍යාඥයකු හැටියට ඔබතුමාට තේරෙනවා ඇති, අපි මධ්‍යම සංවර්ධන රටක් කියන උගුලෙන් අපට ගොඩ එන්නට පුළුවන් වන්නේ විද්‍යාව පදනම් කර ගෙන අපේ රටේ තාක්ෂණය දියුණු කිරීමෙන් බව. අපේ ශ්‍රම වියදම වැඩි වෙන්න, වැඩි වෙන්න අපි ඒ උගුලට යට වෙලා සංවර්ධන වේගය පහළ බහිනවා. ඒ තත්ත්වයට මේ රට වැටෙන්න ඉඩ දෙන්න එපා. කරුණාකර අපේ රටේ නියම සංවර්ධනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය විද්‍යාව හා තාක්ෂණය දියුණු කිරීම සම්බන්ධයෙන් යම් බරක් යොදවන්න. විද්‍යා හා තාක්ෂණ කටයුතු අමාත්‍යාංශය දැන් සම්පූර්ණයෙන්ම නැති කරලා තිබීම ගැන මම කනගාටු වෙනවා. COSTI ආයතනය ගැනත් මම ඔබතුමා සමඟ කථා කළා. COSTI ආයතනය තුළිනුත් අපි බැලුවේ පුළුවන් තරම් අපේ විද්‍යාවයි, තාක්ෂණයයි දියුණු කරලා ඒ හරහා මේ රටේ අමු ද්‍රව්‍යවලට උපරිම වටිනාකමක් එකතු කරන සංවර්ධනයක් ඇති කරන්නයි. මේ අවස්ථාවේ දී මා